© සියලු ම හිමිකම් ඇවිරිණි

අනු අංකය: ………………

# ශ්‍රී ලංකා සහතිකලත් කළමනාකරණ ගණකාධිකාරින්ගේ සංගමය

## ශිල්පීය අදියර
## න්‍යාමක ප්‍රශ්න පත්‍රය

පිටු ගණන : 05
ප්‍රශ්න ගණන : 06

<u>අයදුම්කරුවන්ට උපදෙස්:</u>

1. නියමිත කාලය පැය 3 කි.
2. සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
3. පිළිතුරු එක් භාෂාවකින් (සිංහල) පමණක් ලියන්න.

| විෂය | විෂය සංකේතය |
|---|---|
| මූලික මූල්‍ය ගිණුම්කරණය | (FAF) 501 |

---

**ප්‍රශ්න අංක 01** *(ලකුණු 15)*

පොදු උපයෝගිතා ද්‍රව්‍යයක් විශාල ප්‍රමාණයෙන් නිෂ්පාදනය කරන කේවල ස්වාමි ව්‍යාපාරිකයෙකු වූ ඩික්මන්ස් ඇබ්රිකේටර්ස් ආයතනයේ 31.12.2005 දිනට අදාළ ශේෂ පහත දැක්වේ.

| | රු. | රු. |
|---|---|---|
| <u>01.01.2005 දිනට තොග</u> | | |
| අමුද්‍රව්‍ය | 15,000 | |
| නොනිමි වැඩ | 2,000 | |
| නිමි භාණ්ඩ | 20,000 | |
| ලිහිල් මෙවලම් | 9,000 | |
| කාර්යාල වේතන | 68,600 | |
| ගෙනයෑමේ කුලී | 3,360 | |
| ගෙනඒමේ කුලී | 15,340 | |
| මෝටර් වැන්රථ වියදම් | 8,000 | |
| විකුණුම් | | 1,000,000 |
| අමුද්‍රව්‍ය ගැනුම් | 276,000 | |
| වරිපනම් හා ගෙවල් කුලී | 60,000 | |
| එළිය හා උෂ්ණය | 56,400 | |
| කර්මාන්තශාලා යන්ත්‍ර හා උපකරණ සඳහා රක්ෂණ | 4,200 | |
| ඍජු කර්මාන්තශාලා වැටුප් | 295,000 | |
| කර්මාන්තශාලා සුපරීක්ෂ වේතන | 26,000 | |
| යන්ත්‍ර නඩත්තු කිරීම් | 14,000 | |
| පුරස්කාර | 30,000 | |
| පැස්සීමේ වියදම් | 14,160 | |
| <u>31.12.2005 දිනට ඉතිරි තොග</u> | | |
| අමුද්‍රව්‍ය | 10,340 | |
| නොනිමි වැඩ | 10,000 | |
| නිමි භාණ්ඩ | 26,000 | |

පහත සඳහන් අතිරේක තොරතුරු ද සපයා ඇත.

(i) වැරදි ලෙස හැසිරවීම නිසා රු. 11,000 ක් පිරිවැය වූ අමුද්‍රව්‍ය හානියට පත්ව ඇත.

(ii) වියදම් පහත දැක්වෙන ආකාරයට බෙදා වෙන් කළ යුතුය.

| | |
|---|---|
| එළිය හා උෂ්ණය - කර්මාන්තශාලාවට | 60% |
| කාර්යාලයට | 40% |
| ගෙවල් කුලී හා වරිපනම් - කම්හලට | 75% |
| කාර්යාලයට | 25% |

(iii) මෝටර් වෑන්රථ වියදම් පහත දැක්වෙන ආකාරයට බෙදා වෙන් කළ යුතුය.

| | |
|---|---|
| කම්හලට | 50% |
| විකිණීමේ හා බෙදාහැරීමට | 30% |
| කාර්යාලයට | 20% |

(iv) පහත සඳහන් වියදම් උපචිත වේ.

| | |
|---|---|
| ගෙනඒමේ කුලී | රු. 10,000 |
| කාර්යාල විදුලිය | 2,000 |

(v) නිපදවනු ලබන සෑම ඒකකයටම පුරස්කාර ගෙවිය යුතුය. පැස්සීමේ ගාස්තු ඍජු වියදමක් ලෙස සැළකිය හැකි ය.

(vi) ක්ෂයවීම් පහත සඳහන් පිරිදි වෙන් කළ යුතුය.

| | |
|---|---|
| කර්මාන්තශාලා ගොඩනැගිල්ල | රු. 4,000 |
| යන්ත්‍ර | 14,000 |
| මෝටර් වෑන්රථ | 10,000 |
| කාර්යාල උපකරණ | 8,000 |

(vii) 31.12.2005 දිනට ලිහිල් මෙවලම්වල අගය රු. 7,000 යැයි ගණන් බලා ඇත.

(viii) වෙළෙඳ ගිණුමට මාරු කිරීමට පෙර කර්මාන්තශාලා පරිපාලන වියදම් වශයෙන් 3% ක් කර්මාන්තශාලා ගිණුම්වලට එකතු කළ යුතුය.

(ix) වර්ෂය තුළ මෙම ව්‍යාපාරය ඒකක 80,000 ක් නිපදවා තිබිණ.

*ඔබ විසින්:*

(a) 31.12.2005 දිනෙන් අවසන් වසර සඳහා නිෂ්පාදන ගිණුම පිළියෙල කළ යුතුය. **(ලකුණු 13)**

(b) වෙළෙඳ ගිණුමට මාරු කරන ලද භාණ්ඩවල කර්මාන්තශාලා පිරිවැය හා ඒකකයක පිරිවැය සොයන්න. **(ලකුණු 02)**

**(මුළු ලකුණු 15)**

## <u>**ප්‍රශ්න අංක 02** *(ලකුණු 25)*</u>

පහත දැක්වෙන්නේ 31.12.2005 දිනට CMA ආයතනයේ ශේෂ පිරික්සුමයි.

| | හර | බැර |
|---|---|---|
| <u>නිකුත් කළ කොටස් ප්‍රාග්ධනය</u> | | |
| එකක් රු. 10 ක්වූ සාමාන්‍ය කොටස් 20,000 | | 200,000 |
| එකක් රු. 10 ක්වූ වරණීය කොටස් 5,000 | | 50,000 |
| ඉඩම් හා ගොඩනැගිලි (පිරිවැයට) | 300,000 | |
| ලී බඩු උපකරණ හා සවිකිරීම් (පිරිවැය) | 80,000 | |
| මෝටර් රථ (පිරිවැය) | 125,000 | |
| පොදු සංචිතය | | 30,000 |
| <u>ක්ෂය සඳහා වෙන්කිරීම</u> | | |
| පරිශ්‍රමය | | 55,000 |
| ලී බඩු හා සවිකිරීම් | | 20,000 |
| මෝටර් රථ | | 75,000 |
| කීර්තිනාමය | 150,000 | |

| | | |
|---|---|---|
| පෙර ගෙවුම් | 36,150 | |
| අධ්‍යක්ෂ වේතන | 24,000 | |
| කොටස් අධිමිල ගිණුම | | 35,000 |
| ලාභාලාභ ගිණුම | | 23,500 |
| ඉතිරි තොග 01.01.2005 | 10,280 | |
| ගෙවල් කුලී හා වරිපනම් | 11,000 | |
| විවිධ වියදම් | 1,160 | |
| වැටුප් හා වේතන | 22,000 | |
| ප්‍රචාරණය | 7,200 | |
| බොල් ණය | 640 | |
| බැංකු පොලී | 2,050 | |
| බැංකු ගාස්තු | 250 | |
| බැංකු අයිරාව | | 17,500 |
| බැංකු ශේෂය | 30,000 | |
| අතැති මුදල් | 720 | |
| ගෙවිය යුතු ගිණුම් (ණයහිමියෝ) | | 68,800 |
| බෙදාහැරීමේ වියදම් | 12,000 | |
| ලැබිය යුතු ගිණුම් (ණයගැතියෝ) | 27,000 | |
| 10% ණයකර | | 120,000 |
| ණයකර පොලී | 12,000 | |
| රක්ෂණය | 3,900 | |
| බොල් ණය සඳහා වෙන්කිරීම | | 1,350 |
| ගැනුම් | 308,800 | |
| විකුණුම් (වැට් බදු හැර) | | 468,000 |
| | 1,164,150 | 1,164,150 |

අනෙකුත් තොරතුරු:

(i) 31.12.2005 ට ඉතිරි තොග රු. 13,080 කට තක්සේරු කොට ඇත.

(ii) හීනවන අගයට ක්ෂය වෙන් කළ යුතුය.

| | |
|---|---|
| පරිශ්‍රය | 4% |
| ලී බඩු සහ සවිකිරීම් | 10% |
| මෝටර් රථ සරල මාර්ග ක්‍රමයට | 20% |

(iii) ණයගැතියන්ගෙන් 5% ක් බොල් ණය හා අඩමාන ණය සඳහා වෙන්කරන්න.

(iv) බෙදා වෙන් නොකළ ලාභයෙන් රු. 20,000 ක් පොදු සංචිතයට ද, සාමාන්‍ය කොටස් සඳහා 10% ක්ද, වරණීය කොටස් සඳහා 8% ක්ද ලාභාංශ වශයෙන් වෙන් කිරීමට අධ්‍යක්ෂවරු තීරණය කරති.

*ඔබ විසින් අභ්‍යන්තර ප්‍රයෝජනය සඳහා:*

(i) 31.12.2005 දිනෙන් අවසන් වසර වෙළෙඳ හා ලාභාලාභ ගිණුම ද ලාභාලාභ විසර්ජන ගිණුම ද පිළියෙල කරන්න. **(ලකුණු 14)**

(ii) 31.12.2005 දිනට ශේෂ පත්‍රය ද පිළියෙල කළ යුතුය. **(ලකුණු 11)**

**(මුළු ලකුණු 25)**

**<u>ප්‍රශ්න අංක 03</u>** *(ලකුණු 15)*

31.12.2005 දිනට ජයලාල්ගේ ශේෂ පිරික්සුම සම නොවීය. හර පැත්තට වඩා බැර පැත්ත රු. 4,860 ක් වැඩි විය. වැරදි නිවැරදි කිරීම සඳහා අවිනිශ්චිත ගිණුමක් විවෘත කළේ ය.

පහත දැක්වෙන වැරදි නිවැරදි කිරීමට පෙර රු. 36,000 ක ලාභයක් කෙටුම්පත් ගිණුම්වල දැක්විණ.

(i) නියෝමල් ප්‍රනාන්දුට ණයට විකුණූ රු. 620 ක බඩු දෛනික පොතේ ඇතුලත් කර නැත.

(ii) සීමිත සම්පත් සමාගමට ආපසු හරවා යැවූ රු. 2,000 ක් පිරිවැය වූ බඩු සීමිත සම්පත් සමාගමේ ගිණුමට බැර කොට ගැනුම් ආපසු එවුම් ගිණුමට හර කොට ඇත.

(iii) ගැනුම් ලෙජරයෙන් ශේෂ උපුටා ගැනීමේ දී රු. 150 ක බැර ශේෂයක් අත්හැරී ඇත. ලැයිස්තුවේ මුළු එකතුව වෙළෙඳ ණයහිමියන් හැටියට ශේෂ පිරික්සුමේ සටහන් කොට ඇත.

(iv) වැටුප් ගිණුමේ හර පැත්ත රු. 1,000 ක් වැඩියෙන් ගණනය කර ඇත.

(v) ලැබූ වට්ටම් රු. 450 ක් සැපයුම්කරුගේ ගිණුමේ ඇතුලත් කොට ඇතත්, ලැබූ වට්ටම් ගිණුමේ ඇතුලත් කොට නැත.

(vi) රංජිත් ප්‍රනාන්දුට ණයට විකුණූ රු. 1,200 ක භාණ්ඩ සම්පූර්ණයෙන්ම මගහැරී ඇත.

(vii) රු. 5,900 ක කාර්යාල උපකරණ මිලට ගැනුම් කාර්යාල වියදම් ගිණුමට හර කොට ඇත.

(viii) ගෙවූ විදුලි බිල්වලින් ආපසු ලැබුණ රු. 300 ක මුදලක් මුදල් පොතේ ලැබීම් හැටියට සඳහන් කර ඇතත් වෙනත් කිසිම සටහනක් තබා නැත.

(ix) ගෙවූ ගෙවල් කුලී රු. 4,000 ක් ලද ගෙවල් කුලී වශයෙන් සටහන් කොට ඇත.

*ඔබ විසින්:*

(a) වැරදි නිවැරදි කිරීමේ සටහන් අවිනිශ්චිත ගිණුමේ ඇතුලත් කරන්න. **(ලකුණු 06)**
(b) අවශ්‍ය ජර්නල් සටහන් තබන්න. **(ලකුණු 03)**
(c) වර්ෂයට අදාළ සංශෝධිත ශුද්ධ ලාභය ගණනය කරන්න. **(ලකුණු 06)**

**(මුළු ලකුණු 15)**

**<u>ප්‍රශ්න අංක 04</u>** ***(ලකුණු 25)***

ඇඟලුම් ව්‍යාපාරයක් කරගෙන යන මාක් සහ ස්පෙන්සර් හවුල් ව්‍යාපාරයේ 01.01.2005 දිනට වත්කම් පහත දැක්වේ.

| | රු. |
|---|---|
| මෝටර් රථ (පිරිවැය) | 60,000 |
| වැද්දුම් හා සවිකිරීම් (ක්ෂය අඩු කළ අගය) | 80,000 |
| ඉඩම් හා ගොඩනැගිලි (ක්ෂය අඩු කළ අගය) | 200,000 |
| තොග (පිරිවැයට) | 20,000 |
| ණයගැතියෝ (පිරිවැයට) | 8,200 |
| බැංකු ශේෂය | 21,200 |
| අතැති මුදල් | 1,300 |
| ඇඟලුම් සැපයුම්කරුවන්ට ගෙවිය යුතු | 10,700 |

(i) වර්ෂය තුළ සිදු වූ ගනුදෙනු පහත දැක්වේ.

| | රු. |
|---|---|
| මුදලට විකුණුම් | 350,000 |
| මුදලින් ගෙවූ විකුණුම් වියදම් | 2,400 |
| බැංකුවේ තැන්පත් කළ මුදල් | 520,000 |
| සැපයුම්කරුවන්ට චෙක්පත්වලින් කළ ගෙවීම් | 297,720 |
| (මෙම ගෙවීම් කිරීමේ දී 10% ක වට්ටම් දී ඇත) | |
| <u>වෙනත් චෙක්පත්වලින් කළ ගෙවීම්:</u> | |
| විදුලිය | 12,000 |
| වැටුප් හා වේතන | 60,000 |
| මෝටර් රථ වියදම් | 6,300 |
| ගෙනඒමේ වියදම් | 15,800 |
| බෙදාහැරීමේ වියදම් | 6,000 |
| පරිපාලන වියදම් | 13,800 |
| මුදලට මිල දී ගැනුම් එකතුව | 10,000 |

පොත්වල සඳහන් අගය රු. 5,800 ක්වූ පරණ වෑන් රථයක් රු. 9,000 කට මිල නියම කොට මාරු කරන ලදී. ගෙවිය යුතු ඉතිරි මුදල වූ රු. 26,000 චෙක්පතකින් ගෙවන ලදී.

(ii) 01.07.2005 දින ස්පෙන්සර් තම ප්‍රාග්ධනය රු. 20,000 කින් වැඩි කරන ලද්දේ මාර්ක්ස්ගේ ප්‍රාග්ධනය වූ 200,000 ට සමාන කිරීම සඳහා ය. මුදල් තත්ත්වය වැඩි දියුණු කිරීම සඳහා මාර්ක්ස් මෙදින රු. 20,000 ක් ව්‍යාපාරයට යෙදවීය.

(iii) ස්පෙන්සර් රු. 2,000 ක් වටිනා රෙදිපිළි තම පවුලේ ප්‍රයෝජනය සඳහා ද, මාර්ක්ස් රු. 1,200 ක් වටිනා රෙදිපිළි තම බිරිඳගේ ප්‍රයෝජනය සඳහා ද ව්‍යාපාරයෙන් ගෙන ගොස් ඇත.

(iv) ස්පෙන්සර් රු. 10,200 ක්ද, මාර්ක්ස් රු. 5,840 ක්ද බැංකුවෙන් මුදල් ලබාගෙන ඇත.

(v) ව්‍යාපාරයේ කළමනාකරණ කටයුතුවලට වැටුපක් වශයෙන් මසකට රු. 2,500 ක් ස්පෙන්සර්ට හිමිවන අතර, හවුල්කරුවන්ගේ ප්‍රාග්ධනය සඳහා 5% ක් පොලී හිමි වේ. ජංගම ගිණුම් ශේෂ සඳහා පොලී නොගෙවිය යුතුය.

ගැනිලි සඳහා පොලී:

| | |
|---|---|
| මාර්ක්ස් | රු. 500 |
| ස්පෙන්සර් | රු. 700 |

(vi) ණය ගනුදෙනු සීමා කර ඇතත් බොල් ණය වශයෙන් රු. 300 ක් කපාහැරීමට සිදු විය.

(vii) 31.12.2005 දිනට වත්කම් පහත සඳහන් පරිදි අගය කරන ලදී.

- වැද්දුම් හා සම්කිරීම් — රු. 72,000
- මෝටර් රථ — රු. 71,100
- වෙළෙඳ තොග — රු. 30,800
- ඉඩම් හා ගොඩනැගිලි ක්ෂය නොකළ යුතුය.
- ණයගැතියෝ රු. 7,900 ක් වූ අතර ණයහිමියෝ රු. 10,700 ක් විය.

*ඔබ විසින්:*

(a) ශේෂ සෙවීම සඳහා බැංකු හා මුදල් ගිණුම් පිළියෙල කළ යුතුය. **(ලකුණු 08)**

(b) 31.12.2005 දිනෙන් අවසන් වසර සඳහා හවුල් ව්‍යාපාරයේ වෙළෙඳ හා ලාභාලාභ ගිණුම ද, ලාභාලාභ විසර්ජන ගිණුම ද පිළියෙල කළ යුතුය. **(ලකුණු 09)**

(c) හවුල්කරුවන්ගේ ජංගම ගිණුම් පිළියෙල කරන්න. **(ලකුණු 04)**

(d) 31.12.2005 ට ශේෂ පත්‍රය පිළියෙල කරන්න. **(ලකුණු 04)**

**(මුළු ලකුණු 25)**

## **ප්‍රශ්න අංක 05** *(ලකුණු 10)*

(a) කෙටියෙන් පැහැදිලි කරන්න.

(i) අනුරූපිතා සංකල්පය (Consistency Concept)

(ii) විචක්ෂණ සංකල්පය **(ලකුණු 05)**

(b) මූල්‍ය ලේඛනවලින් අනාවරණය විය යුතු පහත සඳහන් ගුණාත්මක ලක්ෂණ කෙටියෙන් පැහැදිලි කරන්න.

(i) ද්‍රව්‍යාත්මක බව **(ලකුණු 05)**

(ii) අදාළත්වය **(ලකුණු 05)**

**(මුළු ලකුණු 10)**

## **ප්‍රශ්න අංක 06** *(ලකුණු 10)*

පහත සඳහන් ඒවායින් දෙකක් කෙටියෙන් පැහැදිලි කරන්න.

(a) ගිණුම් සටහන් පත්‍රය (Chart)

(b) කාණ්ඩ (සමූහ) පෙරසැරිය (Batch Processing)

(c) පැතුරුම්පත් (Spread Sheets) **(මුළු ලකුණු 10)**

**ප්‍රශ්න පත්‍රය අවසානයි.**